සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation **2021**

ශ්‍රේණිය / தரம் / Grade	6	විෂයය / பாடம் / Subject	විද්‍යාව	පත්‍රය / வினாத்தாள் / Paper	I,II	පැය / மணித்தியாலம் / Hours	2

නම-...

I කොටස

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න.

1. පහත රූපයේ දැක්වෙන්නේ,

1.මුහුදු මලකි. 2. කොරල් බුහුබාවෙකි.

3. ක්ෂුද්‍ර ජීවියෙකි. 4. කකුළුවෙකි.

2. ප්‍රශ්වාස වාතයේ කාබන්ඩයොක්සයිඩ් අඩංගුබව පෙන්වීමට සිදුකරන පරීක්ෂණයක රූපසටහනක් පහත දැක්වේ. එහි A ලෙස දක්වා ඇති දියරය වන්නේ,

1. ජලය
2. පොල් තෙල්
3. හුණු දියර
4. භූමි තෙල්

3. ස්කන්ධයක් නොමැති, අවකාශයේ ඉඩක් නොගන්නා දෑ,

1. පදාර්ථ වේ 2. ශක්ති වේ 3. ජෛව ස්කන්ධ වේ 4. පෙට්‍රෝලියම් වායු වේ.

4. මිටියක් වැනි දැඩි උපකරණයකින් තැලූ විට කුඩු බවට පත් නොවී, තැලිය හැකි වීමේ ගුණය,

1.භංගුරතාව වේ. 2.ප්‍රත්‍යාස්ථ බව වේ.

3.තන්‍යතාව වේ. 4.ආඝාතවර්ධ්‍යතාව වේ.

5. පහත A හා B උපකරණ පිළිවෙලින්,

A



B

1. සංයුක්ත අණ්වීක්ෂය හා දුනු තරාදිය 3. සංයුක්ත අණ්වීක්ෂය හා තෙදඬු තුලාව
2. දුරේක්ෂය හා තෙදඬු තුලාව 4. දුරේක්ෂය හා දුනු තරාදිය

6. ද්‍රව හා වායු අවස්ථාවේ පවතින පදාර්ථය පිළිවෙලින්

1. භූමි තෙල් හා හුමාලය වේ.
2. ජලය හා අයිස් වේ.
3. තඹ හා හුමාලය වේ.
4. හුමාලය හා භූමිතෙල් වේ.

7. වර්ෂාවකදී පොළොව මත පතිතවන ජලයෙහි හැසිරීම නිරීක්ෂණය කිරීමට පිළියෙළ කළ ඇටවුමක් පහත රූපයේ දැක්වේ.



මෙහිදී සිදුරු සහිත ටින් බඳුනෙන් පස් මතට පතිතවන ජලය ,

1. මතුපිට ජලය වේ.
2. භූගත ජලය වේ.
3. වර්ෂණය වේ.
4. මතුපිට ජලය හා භූගත ජලය වේ.

8. පොසිල ඉන්ධනයක් **නොවන්නේ** කුමක් ද ?

1. ගල් අඟුරු
2. පෙට්‍රෝලියම් තෙල්
3. පෙට්‍රෝලියම් වායු
4. පොල්කටු අඟුරු

9. සූර්ය ශක්තිය ප්‍රයෝජනයට ගන්නා උපකරණයක් පහත රූපයේ දැක්වේ. එම උපකරණය කුමක් ද?

1. සූර්ය තාපක උදුනකි.
2. සූර්ය ජල තාපකයකි .
3. සූර්ය පැනලයකි.
4. සූර්ය කෝෂයකි.

10. A , B හා C හිස් තැන්වලට ගැලපෙන පිළිතුර තෝරන්න.

යොදාගත් ද්‍රව්‍ය	පාරාන්ධ/ පාරදෘශ්‍ය /පාරභාෂක බව	යොදාගත් අවස්තාව
1.වීදුරු	A	රාමුකරන ලද පින්තූරයක මුහුණත
2. සව් කඩදාසි	B	වෙසක් කූඩු සෑදීම
3. කාඩ්බෝඩ්	C	ඡායාරූප පටල බහා ඇති පෙට්ටිය

1. පාරභාෂක, පාරදෘශ්‍ය, පාරාන්ධ
2. පාරභාෂක, පාරාන්ධ, පාරදෘශ්‍ය
3. පාරාන්ධ, පාරදෘශ්‍ය, පාරභාෂක
4. පාරදෘශ්‍ය, පාරභාෂක, පාරාන්ධ

11. පහත රූපයෙන් දැක්වෙන්නේ පන්ති කාමරයේ සිදුකරන ලද ක්‍රියාකාරකමකි. සබන් දිය කළ ජලය සහිත බෝතලයකට ලේසර් විදුලි පන්දමක ආලෝකය යොමුකර ඇත. මෙයින් තහවුරු වන්නේ,



1. ආලෝකයේ ගමන් මග සරල රේඛීය නොවන බවය.
2. ආලෝකයේ ගමන් මග සරල රේඛීය වන බවය.
3. ආලෝකය ගමන් කිරීමට මාධ්‍යයක් අවශ්‍ය බවය.
4. ආලෝකය ගමන් කිරීමට මාධ්‍යයක් අවශ්‍ය නොවන බවය.

12. බෙරයක ආකාරයට ශබ්දය නිපදවන භාණ්ඩ වර්ගය තෝරන්න.

1. ගිටාරය 2. බටනලාව 3. උඩැක්කිය 4. වයලීනය

13. රූපයේ දක්වා ඇත්තේ ජලය අඩංගු වීදුරුවකට දමා ඇති ඇමුණුම් කටුවකි. විදුරු තුළට අත හෝ වෙනත් කිසිවක් හෝ නොදමා වීදුරුවේ ජලය ඉවත් නොකර ඇමුණුම් කටුව පිටතට ගැනීමට ඔබ යොදාගන්නේ,

1. මාලිමාවකි
2. තවත් ඇමුණුම් කටුවකි
3. කාන්දම් කැබැල්ලකි
4. යකඩ ඇණයකි

14. චුම්බක ධ්‍රැව ලෙස හඳුන්වන්නේ

1. චුම්බකයක ආකර්ෂණ බල වැඩි වශයෙන් ඇති ප්‍රදේශ වේ.
2. චුම්බකයක ආකර්ෂණ බල නැති ප්‍රදේශ ය.
3. චුම්බකයක ආකර්ෂණ බල අඩු ප්‍රදේශ ය.
4. චුම්බකයක වීකර්ෂණ බල නැති ප්‍රදේශ ය.

15. පහත සඳහන් උපකරණය

1. ඇමීටරයකි
2. ගැල්වනෝමීටරයකි
3. වෝල්ට් මීටරයකි
4. මිලි ඇමීටරයකි

16. පහත දක්වා ඇත්තේ සරල කෝෂයකි. එහි A හා B තහඩු පිළිවෙලින් ,



1. කොපර් තහඩුව හා සින්ක් තහඩුවය.
2. සින්ක් තහඩුව හා ප්ලාස්ටික් කැබැල්ලක් .
3. කොපර් තහඩු දෙකක් ය.
4. සින්ක් තහඩු දෙකක් ය.

17. පහත සඳහන් සංකේතයෙන් පෙන්වන්නේ,



1. ආලෝක සංවේදී ප්‍රතිරෝධකය
2. ප්‍රතිරෝධකය
3. ඇමීටරය
4. විද්‍යුත් කෝෂය

18. මිනිස් සිරුරේ සාමාන්‍ය උෂ්ණත්වය ,

1. 30 ^{0} C 2. 40 ^{0} C 3. 37 ^{0} C 4. 39 ^{0} C

19. පහත සඳහන් ප්‍රකාශවලින් **අසත්‍ය** වන්නේ,

1.ආහාර දාමයක ඇති සෑම පුරුකක්ම පරිසරයේ සමතුලිත බව පවත්වා ගෙන යාමට වැදගත් වේ.

2. ආහාර දාමයක ඇති ජීවියෙක් විනාශ වුවහොත් එය ආහාර දාමයේ අනෙක් පුරුක්වල පැවැත්ම කෙරෙහි බලපායි.

3. සතුන් ගන්නා ආහාරවල පුළුල් විවිධත්වයක් ඇති විට එම සතුන්ගේ පැවැත්ම වඩාත් තහවුරු වේ.

4. ආහාර දාමයක් යනු ආහාර සඳහා ජීවීන් අතර ඇති සම්බන්ධතා නිරූපණය කරන ආහාර ජාල කිහිපයක සම්බන්ධතාවකි.

20. පහත රූප සටහන්වලින් දැක්වෙන උපකරණවල කාර්ය පිළිවෙලින්,





1.සුළගේ වේගය හා සුළගේ දිශාව මැනීම. 2. සුළගේ දිශාව මැනීම හා සුළගේ වේගය මැනීම.

3.සුළගේ දිශාව හා ආර්ද්‍රතාව මැනීම. 4. ආර්ද්‍රතාව මැනීම හා සුළගේ දිශාව මැනීම.

II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01). (A) පහත දක්වා ඇත්තේ වියළි කෝෂ 2ක් සම්බන්ධක කම්බි, ස්විචයක්, විදුලි පන්දම් බල්බයක් උපයෝගී කරගෙන සකසා ඇති අටවුමකි.



(i). ඇටවුම ක්‍රියාත්මක කළ විට ඔබට ලැබෙන නිරීක්ෂණය කුමක් ද?

(ii) ඉහත ඇටවුම සම්මත සංකේත භාවිතයෙන් අඳින්න.

(iii) විදුලි පරිපථයක් යනු කුමක්ද ?

B) විදුලිය ගලන ද්‍රව්‍ය හා විදුලිය ගලා නොයන ද්‍රව්‍ය සොයා බැලීමට සකස් කළ ඇටවුමක් පහත දැක්වේ.



(i) A හා B හිඩැසට පහත සඳහන් ද්‍රව්‍යවලින් කුමන ද්‍රව්‍ය තැබූ විට බල්බය දැල්වේ ද?

a. වියළි කෝෂයක කාබන් කූර

b. පැන්සල් කූර

c. ප්ලාස්ටික් කැබැල්ල

d. පොලිතින් කැබැල්ල

(ii) විදුලිය ගලන ද්‍රව්‍ය හඳුන්වන නම ලියන්න

(iii) විදුලිය නොගලන ද්‍රව්‍ය හඳුන්වන නම ලියන්න.

(C)

i). මෙම රූපයෙන් දැක්වෙන ඉලෙක්ට්‍රොනික උපාංගය කුමක් ද ?

ii)මෙහි දිගින් වැඩි අග්‍රය කුමන නමකින් හඳුන්වයි ද?

iii) මෙහි දිගින් අඩු අග්‍රය කුමන නමකින් හඳුන්වයි ද?

D)



රූපයේ දැක්වෙන ලිපෙහි ඉන්ධනය ලෙස ජෛව ස්කන්ධ භාවිතා කරයි.

i) ජෛව ස්කන්ධ යනු කුමක් ද ?

ii) මෙම ලිප සඳහා යොදා ගන්නා ජෛව ස්කන්ධය කුමක් ද ?

iii) ඔබ දන්නා තවත් ජෛව ස්කන්ධ ලියන්න.

iv) මෙම ලිපෙහි වාසියක් ලියන්න.

(ලකුණු 16)

02). A). ශිෂ්‍යයකු විසින් ජල සාම්පල දෙකක් රැස්කරන ලදී.

A සාම්පලය- පිදුරු පල්කළ ජලය ස්වල්පයක්

B සාම්පලය - පොකුණකින් ලබාගත ජලය ස්වල්පයක්

i) එම සාම්පල වෙන වෙනම කදාවලට ගෙන එක්තරා උපකරණයකින් නිරීක්ෂණය කරන ලදී. එම උපකරණයේ නම ලියන්න.

ii) පියවි ඇසට නොපෙනෙන ජීවීන් කුමන නමකින් හඳුන්වන්නේද?

iii) ජීවීන් බෙදන ප්‍රධාන කොටස් තුනකි. පහත සටහනෙහි හිස්තැන් පුරවන්න.

ජීවීන්

	සතුන්	

B) පහත රූපයේ දැක්වෙනුයේ හරිත ශාක ආහාර නිපදවන ක්‍රියාවලියට අදාළ රූපයකි. එහි කොටුව තුළ සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.

(ඔක්සිජන්, කාබන් ඩයොක්සයිඩ්, සූර්යාලෝකය, ජලය)



C) ජීවීන් වර්ගීකරණය සඳහා දෙබෙදුම් සුචි යොදා ගනියි. පහත දෙබෙදුම් සුචිය සම්පූර්ණ කරන්න.

ගිරවා, ගැඩවිලා, ගෝනා , කපුටා

පාද හතරක් ඇති — ....

b ....

a

ගිරවා, ගැඩවිලා, කපුටා

පියාපත් ඇති — d .... e ....

c...........................

ගැඩවිලා

කොළපාට පිහාටු ඇති — ගිරවා

f .... — කපුටා

(ලකුණු 11)

3) A) පහත දැක්වෙන වගන්ති හරි නම් "√ "ලකුණ ද වැරදි නම් "X" ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

i . වාතය අවකාශයේ ඉඩක් ගනීයි . ( )

ii. උදම් රළ මගින් විදුලිය නිපදවිය හැකිය ( )

iii. සූර්යයා ශක්ති ප්‍රභවයක් නොවේ. ( )

iv . ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රතිශතය 0.01% වේ. ( )

v ළදරු සූප්පු හා අත් ආවරණ වැනි ද්‍රව්‍ය සෑදීමට රබර් යොදා ගන්නේ රබර් සතු හංගුර බව නිසාය. ( )

B) A හා B නිවැරදිව යා කරන්න

	A	B
i.	ළිංවලින් හා උල්පත්වලින් අපට ලැබෙනුයේ.	සෝඩියම් ක්ලෝරයිඩ්
ii.	මුහුදු ජලයේ දිය වී ඇති ලවණයකි	පොසිල ඉන්ධන
iii.	අඟුරුවල පවතින භෞතික ගුණය වන්නේ	ශක්තියයි.
iv.	කිවුල් දිය පිරි ජලාශයකි	භූගත ජලය
v.	කාර්යය කිරීමේ හැකියාව	කලපුව
vi.	පෘථිවි අභ්‍යන්තරයේ උෂ්ණත්වය හා පීඩන වෙනස්කම් නිසා නිර්මාණය වේ.	හංගුරතාවය

(ලකුණු 11)

4) A) වරහන් තුළ සපයා ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

(උෂ්ණත්වමානය, හම්බන්තොට, ප්‍රභව, වඩදිය හා බාදිය, එන්ඩොස්කෝපය, න්‍යෂ්ටික , දීප්ත වස්තු)

i. ශක්තිය සපයන දෑ ශක්ති .... නම් වේ.
ii. උෂ්ණත්වය මැනීම සඳහා .... භාවිතා වේ.
iii. ශ්‍රී ලංකාවේ, සුළං බලාගාර ඉදිකර ඇති ප්‍රදේශයකි ,................................ .
iv. චන්ද්‍රයාගේ හා සූර්යයාගේ බලපෑම නිසා සාගරයේ ජල මට්ටම වරින් වර වෙනස වීම, ... ඇතිවීම ලෙස හඳුන්වයි.
v. පරමාණුවලින් ලබාගන්නා .... ශක්තිය උපයෝගී කරගෙන විදුලිය නිපදවයි.
vi. තමා විසින් ආලෝකය නිකුත් කරන වස්තු..නම් වේ.
vii. .... භාවිතා කරන්නේ ශරීර අභ්‍යන්තරය නිරීක්ෂණය සඳහාය.

B) කාලගුණය යනු කෙටි කාලයක් තුළ, නිශ්චිත ප්‍රදේශයක පවතින වායුගෝලීය තත්ත්වයයි . කාලගුණික තත්ත්වවල සිදුවන අනපේක්ෂිත වෙනස්වීම් නිසා ස්වාභාවික ආපදා ඇතිවේ.

i.) කාලගුණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේදී බහුලව භාවිතාවන සාධක හතර ලියා දක්වන්න.

ii.) කාලගුණික වෙනස්වීම් නිසා ඇතිවන ස්වභාවික ආපදා දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 11)

5) විවිධ දෑ කම්පනය වීම නිසා ශබ්දය හෙවත් ධ්වනිය උපදී.

i) ධ්වනිය නිපදවන වස්තු කුමන නමකින් හඳුන්වයි ද ?

ii) රිද්මයානුකූල නොවන අවිධිමත් ශබ්ද ඝෝෂා ලෙස හඳුන්වයි. නාගරික පරිසරයකදී ඇසෙන ඝෝෂාකාරී ශබ්ද වර්ග දෙකක් ලියා දක්වන්න.

iii) ධ්වනිය සම්බන්ධ ප්‍රයෝගික ක්‍රියාකාරකම්වලදී 6 ශ්‍රේණියේ සිසුන් නිර්මාණය කළ උපකරණයක් රූපයේ දැක්වේ.



a) ඉහත උපකරණය කුමක්ද?

b) එම උපකරණය සෑදීමට ඔබ යොදාගත් ද්‍රව්‍ය දෙකක් ලියන්න.

c) ඉහත නිර්මාණය කළ උපකරණයෙහි ශබ්දය නිපදවන ආකාරයට ශබ්දය නිපදවන භාණ්ඩ දෙකක් නම් කරන්න.

iv) ධ්වනිය සඳහා සංවේදී ඉන්ද්‍රිය කුමක් ද?

v) අන් අයට බාධා නොවන පරිදි ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර අප භාවිතා කරන්නේ කෙසේ ද?

(ලකුණු 11)

6) i) පහත සඳහන් චුම්බක වර්ගවල නම් ලියා දක්වන්න.

a b c d

ii) යකඩ කැබැලි, පිත්තල ඇණ, තඹ කම්බි, කාසියක්, අල්පෙනෙත්තක්, ප්ලාස්ටික් කැබැල්ලක්, ඉදිකටුවක්, ලී කැබැල්ලක්

ඉහත ද්‍රව්‍ය පහත වගුවට සුදුසු පරිදි ඇතුලත් කර සම්පූර්ණ කරන්න.

චුම්බකයට ආකර්ෂණය වන ද්‍රව්‍ය	චුම්බකයට ආකර්ෂණය නොවන ද්‍රව්‍ය
1.	
2.	
3.	
4.	

iii) a) පහත A හා B අවස්ථා දෙකෙන් චුම්බක දෙක ආකර්ෂණය වන අවස්ථාව නම් කරන්න.

b) එසේ ආකර්ෂණය විමට හේතුව කුමක් ද?

iv) චුම්බකයක් සැමවිටම උතුරු -දකුණු දිශාව ඔස්සේ නිශ්චලව පිහිටන විට උතුරු දිශාවට යොමුවී ඇති කෙළවර කුමක් ද ?

v) චුම්බක ප්‍රයෝජනයට ගන්නා අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 11)

7) A) ඝන ද්‍රව්‍යවල ප්‍රසාරණය අධ්‍යයනය කිරීමට යොදා ගත් ඇටවුමක් පහත දැක්වේ.



i. කම්බි පුඩුව රත් කිරීමේදී දක්නට ලැබෙන නිරීක්ෂණය කුමක්ද?

ii) එම නිරීක්ෂණයට හේතුව ලියන්න.

B) i. සතුන් ලබාගන්නා ආහාර වර්ග පදනම් කර ගනිමින් එම සතුන් ප්‍රධාන කාණ්ඩ තුනකට බෙදා දැක්විය හැක. එම කාණ්ඩ තුන ලියා දක්වන්න.

ii)



a) ඉහත ආහාර ජාලයේ නිෂ්පාදකයා කවුද?

b) ඉහත ආහාර ජාලයේ පුරුක් තුනකින් සමන්විත ආහාර දාමයක් ලියන්න.

c) ඉහත ආහාර දාමයේ තෙවන පුරුක නියෝජනය කරන සත්ත්වයා කවුරුන්ද?

d)එම ආහාර දාමයේ පළමු පුරුකට ඇතුළත් ජීවියාගේ විශේෂිත ලක්ෂණයක් දක්වන්න.

iii) සමහර සතුන් එකම ආහාර වර්ගයක් මත පමණක් යැපීම නිසා වඳවී යාමේ තර්ජනයට ලක්වේ.මෙවැනි සත්ත්වයකු ලියා දක්වන්න.

C) i) වසර දෙකකට පෙර ආරම්භ වී අදටත් ලොව පුරා පැතිරී යන භයානක වෛරස් රෝගය කුමක්ද?

ii) එම රෝගයෙන් ආරක්ෂාවීමට ගත යුතු ක්‍රියාමාර්ගයක් ලියන්න.

(ලකුණු 11)

6 ශ්‍රේණිය - තෙවන වාර ඇගයීම 2021

පිළිතුරු පත්‍රය

I කොටස

1) 1
2) 3
3) 2
4) 4
5) 2
6) 1
7) 3
8) 4
9) 1
10) 4
11) 2
12) 3
13) 3
14) 1
15) 2
16) 1
17) 1
18) 3
19) 4
20) 2

(ල.$20 \times 2 = 40$)

II කොටස

1) (A)

(i) බල්බය දැල්වූ විට (ල.01)

(ii) නිවැරදි පිළිතුරට (ල.02)

(iii) විදුලි ධාරාවක් ගලායාමට සකසා ඇති පද්ධතියක් (ල.02)

(B)

(i) වියළි කෝෂයක කාබන් කූර, පැන්සල් කූර (ල.02)

(ii) විද්‍යුත් සන්නායක (ල.01)

(iii) විද්‍යුත් පරිවාරක (ල.01)

(C)

(i) ආලෝක විමෝචක ඩයෝඩය (LED) (ල.01)

(ii) ධන අග්‍රය (ල.01)

(iii) සෘණ අග්‍රය (ල.01)

(D)

(i) ඉන්ධනයක් ලෙස භාවිතා කළ හැකි ශාක හා සත්ත්ව ද්‍රව්‍ය (ල.01)

(ii) ලී කුඩු හෝ දහයියා (ල.01)

(iii) දර, පොල්කටු අඟුරු, පිදුරු හෝ නිවැරදි පිළිතුරක් (ල.01)

(iv) වියදම අඩුවීම (ල.01) (මුළු ලකුණු 16)

2) (A) (i) සංයුක්ත අන්වීක්ෂය (ආලෝක අන්වීක්ෂය) (ල.02)

(ii) ක්ෂුද්‍ර ජීවීන් (ල.01)

(iii) ශාක, සතුන්, ක්ෂුද්‍රජීවීන් (ල.03)

(B) a- සූර්ය ශක්තිය

b- ඔක්සිජන්

c- කාබන්ඩයොක්සයිඩ්

d- ජලය (ල.02)

(C) a- පාද හතරක් නැති

b- ගෝනා

c -පියාපත් නැති

d-e- ගිරවා, කපුටා

f- කොළපාට පිහාටු නැති (ල.$\frac{1}{2}$ × 6 = 3) (මුළු ලකුණු 11)

3)

A.

(i) ✓
(ii) ✓
(iii) ×
(iv) ✓
(v) × (ල.05)

B.

	A	B
i.	ළිංවලින් හා උල්පත්වලින් අපට ලැබෙනුයේ	සෝඩියම් ක්ලෝරයිඩ්
ii.	මුහුදු ජලයේ දිය වී ඇති ලවණයකි	පොසිල ඉන්ධන
iii.	අඟුරුවල පවතින භෞතික ගුණය වන්නේ	ශක්තියයි.
iv.	කිවුල් දිය පිරි ජලාශයකි	භූගත ජලය
v.	කාර්යය කිරීමේ හැකියාව	කලපුව
vi.	පෘථිවී අභ්‍යන්තරයේ උෂ්ණත්වය හා පීඩන වෙනස්කම් නිසා නිර්මාණය වේ.	හංගුරතාවය

(ල.06)

(මුළු ලකුණු 11)

4.

A.

(i) ශක්ති ප්‍රභව

(ii) උෂ්ණත්වමානය

(iii) හම්බන්තොට

(iv) වඩදිය හා බාදිය

(v) න්‍යෂ්ටික

(vi) දීප්ත වස්තු

(vii) එන්ඩොස්කෝපය (ල.07)

B.

(i) වර්ෂාපතනය

උෂ්ණත්වය

ආර්ද්‍රතාව

සුළඟේ වේගය හා දිශාව (ල.02)

(ii) සුළි සුළං, ගංවතුර, නියඟය, නායයාම (ල.02) (මුළු ලකුණු 11)

5.

(i) ධ්වනි ප්‍රභව (ල.01)

(ii) නිවැරදි පිළිතුරට (ල.02)

(iii)

a) ටින් වීණාව (ල.01)

b) සිහින් කම්බි/ කුඩා ටින් එකක්/ ඇණ කිහිපයක්/ තුනී ලෑලි කෑල්ලක් (ල.02)

c) නිවැරදි පිළිතුරට (ල.02)

(iv) කණ (ල.01)

(v) නිවැරදි පිළිතුරට (ල.02) (මුළු ලකුණු 11)

6.

(i) a = බුරුප චුම්බක

b = දණ්ඩ චුම්බක

c = u හැඩැති චුම්බක

d = වලයාකාර චුම්බක (ල.02)

(ii)

චුම්බකයට ආකර්ෂණය වන ද්‍රව්‍ය	චුම්බකයට ආකර්ෂණය නොවන ද්‍රව්‍ය
1. යකඩ කැබලි	පිත්තල ඇණ
2. කාසිය	ප්ලාස්ටික් කැබැල්ල
3. ඇල්පෙනෙත්ත	ලී කැබැල්ල
4. ඉඳිකටුව	තඹ කම්බි

(ල.04)

(iii)

a) B

b) විජාතීය ධ්‍රැව නිසා (ල.02)

(iv) උත්තර ධ්‍රැවය (ල.01)

(v) නිවැරදි පිළිතුරට (ල.02)

(මුළු ලකුණු 11)

7.

A.

(i) කම්බි පුඩුව තුළින් වීදුරු බෝලය ගමන් කිරීම (ල.01)

(ii) කම්බි පුඩුව ප්‍රසාරණය වීම (ල.01)

B.

(i) (a) ශාක භක්ෂක

(b) මාංශ භක්ෂක

(c) සර්ව භක්ෂක (ල.03)

(ii) (a) ශාක

(b) ශාක ⟶ මීයා ⟶ ගැරඬියා

(c) ගැරඬියා

(d) ආහාර නිෂ්පාදනය කිරීමට (ල.02)

(iii) පැන්ඩා (ල.01)

C.

(i) කොවිඩ් 19 (ල.01)

(ii) සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් අනුගමනය කිරීම, එන්නත් ලබා ගැනීම, මුඛ ආවරණ පැළඳීම (ල.02)

(මුළු ලකුණු 11)

For more past papers and exam resources,visit www.pastpaperszone.lk